# ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල ඇබෑර්තු

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) මනා ලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් තුළ උපාය මාර්ගික සැලසුම්, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණයක් තුළින්, ජාතික නීතිකාරක අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) අනුගත වන ආරක්ෂාකාරී, ප්‍රවේශ සහිත, කාර්යක්ෂම, ක්‍රමාණුකූල හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක් මෙහෙයවීම සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත තම ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, සිවිල් ගුවන් සේවා ක්ෂේත්‍රයේ ඉහළ සුදුසුකම් හා පෘථුල පළපුරුද්ද සහිත උද්යෝගී, දැඩි උනන්දුවක් සහිත හා ස්වයං උද්යෝගී අයවලුන් අවශ්‍යව ඇත.

## අධ්‍යක්ෂ (මානව සම්පත් හා දේපළ කළමනාකරණ)
## තනතුරු කේතය : HM-1-1-D9 තනතුරු ගණන - 01

**ලබාදීමට නියමිත වැටුප් :** (වැටුප් පරිමාණය (HM 1-1) - රුපියල් 80,295 -15X2,270 - 114,345 - MS චක්‍රලේඛ 02/2016(I) ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව හිමිවන මාසික වැටුප දළ වශයෙන් රුපියල් 173,595.00 වන අතර, එයට, මූලික වැටුප, ජීවන අංක දීමනාව, වෘත්තීය දීමනාව, මාසික දීමනාව, අන්තර් දීමනාව හා ප්‍රවාහන දීමනාවද අදාළ චක්‍රලේඛ ප්‍රකාරව අයත් වේ.
- ඉන්ධන දීමනාව, මසකට ලීටර් 115 වටිනාකමට හිමිය. (අදාළ අවස්ථාවේ පවත්නා මිලට) .
- වෙනත් ප්‍රතිලාභ : සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය, මරණ ප්‍රදාන යෝජනා ක්‍රමය, ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම්, සංනිවේදන පහසුකම්

| **සුදුසුකම් හා පළපුරුද්ද** | |
|---|---|
| **බාහිර අයදුම්කරුවන්**<br>ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණ පරිපාලන හෝ වාණිජ ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු කාලයක ප්‍රථම උපාධියක්<br>සමග<br>කළමනාකරණ පරිපාලන හෝ වාණිජ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (මාස්ටර්ස්) හෝ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය<br>සහ<br>සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක / රජය සතු සමාගමක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක මානව සම්පත් කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයේ අවම වසර දහයක (10) ක පළපුරුද්ද | **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත මනාපය 01 හෝ 02)**<br>**මනාපය 01**<br>බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම<br>**මනාපය 02**<br>මානව සම්පත් හා දේපළ කළමනාකරණ ක්ෂේත්‍රයේ කළමනාකාර ප්‍රභේදයේ (MM 1-1) ශ්‍රේණිය -1 තනතුර ක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br>සහ<br>පසුගිය වසර පහක (05) කාලයක් නිකැලැල් සේවා වාර්තාවක් පවත්වා ගෙන තිබීම හා වර්තමාන තනතුරට අදාළ සියලුම වැටුප් වර්ධක ලබා තිබීම;<br>පසුගිය වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධන ඇගයීම් සඳහා "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම. |

වයස් සීමාව

| තනතුර | වයස් සීමාව | සැලකිය යුතු කරුණු |
|---|---|---|
| අධ්‍යක්ෂ | අවුරුදු 35- අවුරුදු 55 | මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අයදුම්කරුවන් හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) සමාගම, දේශීය ගුවන් සේවා හෝ පියසර පාසල්වල සේවයේ නියුතු අය හට අදාළ නොවේ. |

- අවශ්‍ය වැඩිදුර විස්තර, රැකියා විස්තර, සහ සම්මත අයදුම්පත CAASL නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- අයදුම්කරුවන් විසින් අයදුම් කළ තනතුරු / තනතුර සඳහා තම සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය ලේඛනවල පිටපත් එවිය යුතුය.
- සම්මත අයදුම්පත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුය.
- යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් හෝ ඊමේල් employment@caa.lk මගින් එවීමෙන්, 2024.06.02 දිනට පෙර මෙම කාර්යාල වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, ඒවා ලැබුණු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්පත්, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක යන ලිපිනයට යොමුකළ යුතු අතර, අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
- සුදුසුකම් නිර්ණායක සතුටුදායක ලෙස සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ/ විභාග සඳහා කැඳවනු ලැබේ.

**සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර,**
**කටුනායක.**
**2024.05.19**